

# 9 - සංවර්ධනය සඳහා සන්නිවේදනය



බන්දුල ධර්මතිලක

# සංවර්ධන සංකල්පයේ ආරම්භය හා විකාශය

- 20 වන ශත වර්ෂයේ ආර්ථික විද්‍යාඥයන් හා දේශපාලඥයන් විසින් "ආර්ථික සංවර්ධනය" හෝ "සංවර්ධනය" යනුවෙන් භාවිත කරන ලද යෙදුම **ඒක පුද්ගල ආදායම, ජාතික ආදායම හා ආර්ථික ශුභසාධනයේ ධනාත්මක වර්ධනය** පෙන්නුම් කෙරෙන දර්ශක ලෙස අර්ථ ගන්වා තිබිණි.
- "සංවර්ධන සන්නිවේදනය" යන විෂය ක්ෂේත්‍රය 1950-60 දශකයේ වර්ධනය වූවකි." සංවර්ධනය හා සන්නිවේදනය" (Development and Communication), "සංවර්ධන සනනිවේදනය" (Development Communication) හා සංවර්ධනාත්මක සන්නිවේදනය"(Developmental Communication) යන යෙදුමේ විෂය ආරම්භයේ සිට ම භාවිත විය.
- සංවර්ධන සන්නිවේදනය, යන්නෙන් මූලික වශයෙන් අදහස් කළේ ,ජාතික සංවර්ධනය, සඳහා ජනමාධ්‍ය ඇතුළු වෙනත් සන්නිවේදන මාර්ග උපයෝගී කර ගැනීම යි. ,ජාතික සංවර්ධනය, යන්න සමාජීය, සංස්කෘතික, සදාචාරාත්මක හා ආර්ථික වශයෙන් ප්‍රධාන කොටස් හතරකට බෙදා දැක්වුණු අතර ඉන් ආර්ථික සංවර්ධනයට ප්‍රමුඛතාවක් ලැබිණි.

# සංවර්ධනය යනු ,

ආර්ථික,සමාජීය,සංස්කෘතික,සදාචාරාත්මක, හා පරිසර සංරක්ෂණය ආදී සියළුම අංශ වලින් කිසියම් රටක සිදු වන්නා වූ ප්‍රමාණාත්මක හා ගුණාත්මක වර්ධනය යි

## සංවර්ධනය මනින ආර්ථික විද්‍යාත්මක නිර්ණායක :-

1. සංයුක්ත දර්ශක:-
   - ➡ භෞතික ජීවන තත්ව දර්ශකය (වයස 1 දී ආයු අපේක්ෂාව, ළදරු මරණ අනුපාතය ....)
   - ➡ මානව සංවර්ධන දර්ශකය (උපතේදී ආයු අපේක්ෂාව,සාක්ෂරතාව ආදිය )
   - ➡ මානව දරිද්‍රතා දර්ශකය

2. ආංශික දර්ශක ➡ දළ ජාතික නිෂ්පාදනය හෝ ආදායම
   ➡ ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදිතය හෝ ආදායම

# සංවර්ධනය මනින අනෙකුත් නිර්ණායක :-

- ආර්ථික වර්ධනය
- දුගි බව
- ආදායම් බෙදී යාමේ විෂමතාවය
- සේවා වියුක්තිය
- ශ්‍රම බලකායේ සහභාගීත්ව අනුපාතය
- යහපාලනය හා දේශපාලනික නිදහස
- පරිසරයේ තිරසාර බව ආරක්ෂා කර ගැනීම
- මානසික සහනය ,ආධ්‍යාත්මික දියුණුව
- මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීම
- සහජීවනය



# සංවර්ධන භාවිතාවන් අනුව බෙදුන ලෝක සමාජය

**පළමුවන ලෝකයේ රටවල් :-** ධනේෂ්වර ප්‍රජාතන්ත්‍රවාදී දෘෂ්ඨිවාදයට අනුකූලව ගොඩනැගුණු රටවල්

(අඇමරිකා එක්සත් ජනපදය, එක්සත් රාජධාය, කැනඩාව , බටහිර යුරෝපයේ රටවල්)

**දෙවන ලෝකයේ රටවල් :-** කොමියුනිස්ට් දෘෂ්ඨිවාදයට අනුකූල රටවල්

(සෝවියට් සංගමය, චීනය ,කියුබාව, වියට්නාමය වැනි රටවල්)


**තෙවන ලෝකයේ රටවල් :-** ඉහත කදවුරු දෙකටම අයත් නොවන දළ දේශීය නිෂ්පාදනය අඩු කාර්මික නොවන ව්‍යුහයන් සහිත රටවල්

(අප්‍රිකාව, ඉන්දියානු උප මහද්වීපයට අයත් රටවල් නැගෙනහිර ආසියාව හා සවුදි අරාබිය වැනි රටවල් )

# සංවර්ධනය පිළිබඳ ඇති නිර්වචන

- (1) "සංවර්ධනය යනු රටක දුප්පත්කම, සමාජ අසමානතාව හා විරැකියාව අඩු කිරීම හෝ අහෝසි කිරීම යි." - **ඩඩ්ලි සියර්ස්** (1969)
- (2) "සංවර්ධනය යනු මිනිසුන්ගේ සංවර්ධනය (මානව සංවර්ධනය) මිස, ද්‍රව්‍යමය සංවර්ධනයක් නො වෙයි." - **එඩ්ගා ඕවන්ස්** (1987)
- (3) "සංවර්ධනය යනු 'පූර්ණ සමාජ සංවර්ධනය යි.' එයට මානසික, අධ්‍යාත්මික සහ ද්‍රව්‍යමය අවශ්‍යතා ඇතුළත් වේ."

**- මහත්මා ගාන්ධි**



# සංවර්ධනය සඳහා සන්නිවේදනය

- (1) "සංවර්ධනය සඳහා සන්නිවේදනය යනු සංවාදය සක්‍රිය කරවන, ද්විමාර්ග සන්නිවේදන පද්ධති මඟින් ප්‍රජාවන්ට ඔවුන්ගේ අභිලාෂ හා උත්සුක ප්‍රකාශ කිරීමට හැකි හා ඔවුන්ගේ ම සංවර්ධන ක්‍රියාවලියක අදාළ තීරණවලට සහභාගී ව මැදිහත් වීම යි."
**එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය**
- (2) "සංවර්ධනය සඳහා සන්නිවේදනය යනු පුළුල් පරාසයක මෙවලම් හා ක්‍රම භාවිත කරමින් සංවාදය මත පදනම් වූ සමාජ ක්‍රියාවලියකි. එසේ ම දැනුම, නිපුණතා බෙදාහදා ගැනීම, ගොඩ නැඟීම මෙන් ම ප්‍රතිපත්ති, විවාද සහ ස්ථිරසාර වූ සංවර්ධනයක් සඳහා, සවන්දීම, විශ්වාසය ගොඩනැඟීම හා විවිධ මට්ටම්වල වෙනස්කම් හඳුනා ගැනීම යි. එය මහජන සම්බන්ධතාව හෝ ආයතනික සන්නිවේදනය නො වේ." **සංවර්ධනය සඳහා සන්නිවේදනය පිළිබඳ රෝම සම්මුතිය**
- (3) **සිල්වියෝ වයිස්බෝඩ් (Silvio Waisbord)** සංවර්ධනය සඳහා සන්නිවේදනයේ ප්‍රධාන අදහස් පහක් හඳුනා ගෙන තිබේ.
- (4) **ශ්‍රීනිවාස් මෙල්කොට් (Srinivas Melkote)** සංවර්ධනය සඳහා සන්නිවේදනය පිළිබද නිර්වචනය
- (5) **ස්විඩනයේ මැල්මො විශ්වවිද්‍යාලයයේ** සංවර්ධනය සඳහා සන්නිවේදන අදහස් ද වැදගත් වේ.

# සංවර්ධන සංකල්පයේ නූතන ස්වභාවය

එක්සත් ජාතීන්ගේ සහස්‍රක සංවර්ධන ඉලක්කයන් මඟින් ගෝලීය සංවර්ධන ගැටලු කෙරෙහි අලුත් මාන වර්ධනය වන ක්‍රමවේද හා නව සන්නිවේදන ප්‍රවේශ වැඩි දියුණු කිරීම සඳහා අවස්ථාවක් සපයයි. එක්සත් ජාතීන්ගේ සංවිධානය අන්තර් සම්බන්ධිත සංවර්ධනය සඳහා සන්නිවේදන ප්‍රවේශ හතරක් ප්‍රකාශ කරයි

(1) හැසිරීම් වෙනස්කම් සඳහා සන්නිවේදනය (Communication for behaviour change)

(2) සමාජීය වෙනස්කම් සඳහා සන්නිවේදනය (Communication for social change)

(3) නියාමනය සඳහා සන්නිවේදනය (Communication for regulation)

(4) පාරිසරික සමතුලිතතාව සඳහා සන්නිවේදනය (Communication for ecological balance)

**ජනතා කේන්ද්‍රීයතාව** (People-centered)

**ප්‍රදේශීයකරණය** (Localisation)

**සාමාජීය සම්බන්ධතා හා සමානාත්මතාව ගොඩනැගීම** (Building social relationships and equality)

**දරිද්‍රතාව අවම කිරීම** (Poverty Reduction)

**ප්‍රතිපත්ති සම්පාදනය සඳහා ජනතා මැදිහත් වීම** (Participation of people for policy making)

# සංවර්ධනය සඳහා සන්නිවේදන අවශ්‍යතා

- සංවර්ධනය සඳහා සන්නිවේදන අවශ්‍යතා යනු සන්නිවේදන ක්‍රියාවලි හා ඔවුන්ගේ ම අවශ්‍යතා පිළිබඳ පූර්ණ දැනුම්වත් බවක් ලබා දීමත් වෙනස්කම් සඳහා විකල්ප, ගැටලු විසඳා ගැනීම, සම්මුතික ව කටයුතු කිරීම, තිරසර සංවර්ධනය සඳහා ක්‍රියාකාරකම් සැලසුම් කිරීම, ජනතාවගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය දැනුම හා කුසලතා අත්පත් කර ගැනීම හා ආයතනික කාර්යක්ෂමතාව යනාදියෙහි ඇති වැදගත්කම කියා පෑමත් ය.
- මාධ්‍ය ගුණාත්මකභාවය (Media quality)
- සහභාගිත්වය හා පුද්ගලාන්තර සම්බන්ධතා ශක්තිමත් කිරීම (Enhancing participation and interpersonal relationships)
- අත්‍යවශ්‍ය මානුෂීය තොරතුරු සම්පාදනය (Compiling essential humanitarian information)
- ප්‍රතිසංස්කරණවලට මැදිහත්වීම: සහජීවනය හා ගැටුම් නිරාකරණය (Intervention for reform: conflicts resolution and reconciliation)
- ගෝලීය සංවර්ධනය (Global Development )









# සංවර්ධන ව්‍යාපෘති

ප්‍රතිපත්ති සම්පාදනය සහ මානුෂීය කටයුතු, පුද්ගල හැසිරීම් සහ සමාජීය වෙනස්කම් ප්‍රවර්ධනය කිරීම සඳහා ක්‍රමානුකූල ව, සැලසුම් කළ හා සාක්ෂ්‍ය මත පදනම් වූ මූලෝපායික ක්‍රියාවලියක් ලෙස සංවර්ධන ව්‍යාපෘති හැඳින් විය හැකි යි

**සංවර්ධනය සඳහා සන්නිවේදන ව්‍යාපෘති වාර්තා අදියර**

1. සන්නිවේදනය සඳහා ආරම්භක හේතු හඳුනා ගැනීම
2. සංවර්ධනය සඳහා සංවර්ධන වැඩපිළිවෙළ සැලසුම් කිරීම
3. සංවර්ධනය සඳහා සංවර්ධන ක්‍රියාකාරකම් නියම කිරීම
4. සංවර්ධනය සඳහා සන්නිවේදන දර්ශක තීරණය කිරීම
5. වියදම් ඇස්තමේන්තු කීරීම

- අදාළ ජන කණ්ඩායම් වෙත ගොස් සංවර්ධනය සඳහා සනන්වේදන ව්‍යාපෘති සැලසුම් කිරීමට අවශ්‍ය තොරතුරු ඒකරාශී කර ගැනීම, වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ ජන කණ්ඩායම් දැනුම්වත් කිරීම ආදිය මෙහි දී සිදු වේ.

# සංවර්ධනය සඳහා සන්නිවේදන අපේක්ෂා හඳුනා ගැනීම

- සංවර්ධනය සඳහා සන්නිවේදන අපේක්ෂා යනු **සංස්කෘතිය, මාධ්‍ය, සන්නිවේදනය සහ සංවර්ධනය පිළිබඳ අන්තර් විෂය ක්ෂේත්‍රයකි.** මෙහි දී ගෝලීය හා දේශීය සන්දර්භවල සියලු සමාජීය වෙනස්කම් ගවේෂණය කෙරේ. **තොරතුරු සන්නිවේදනය, අධ්‍යාපනය, හැසිරීම් වෙනස්වීම, සමාජ අලෙවිකරණය, මාධ්‍ය ආචාර ධර්ම, සමාජ වෙනස්කම් සඳහා සන්නිවේදනය සහ ප්‍රජා සහභාගීත්වය** ආදිය මඟින් ජන අපේක්ෂා ඉටු කර ගැනීමේ ක්‍රියාදාමයක් සංවර්ධනය සඳහා සන්නිවේදන අපේක්ෂා යන්නෙන් යෝජනා කෙරේ.
- අවශ්‍යතා කේන්ද්‍රියත්වය (Need Centered)
- ස්වයං නිර්ණය (Self Determination)
- ස්වයං විශ්වාසය (Self-confidence)
- යහපත් පරිසරයක් ගොඩනැගීම(Building a better environment)
- සහභාගීත්ව ප්‍රජාතන්ත්‍රවාදය (Participatory democracy)

# සංවර්ධන ඉලක්ක අභියෝග






ග්‍රාම ශක්ති





